**ජාතික ආරක්ෂක අරමුදල - 2015**

-------------------------------------------

ජාතික ආරක්ෂක අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1985 අංක 09 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 12 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**2.1 මතය**

--------

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික ආරක්ෂක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 01**

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම පිළිබඳ ප්‍රකාශයක් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර නොතිබුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාරව රු. 17,037,875 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.48,440,571 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 66,075,563 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 17,634,992 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ආයෝජන පොළී ආදායම රු. 15,120,606 කින් අඩුවීම හා සුභසාධක වියදම රු. 2,527,015 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ රු.86,634,147 ක් වූ අතිරික්තය 2012 වර්ෂයේදී රු.57,510,514 ක් දක්වා පිරිහී තිබුණි. එය 2013 වර්ෂය වන විට රු.80,688,937 ක් දක්වා වර්ධනය වුවද 2014 වර්ෂයේ රු.66,075,563 ක් හා සමාලෝචිත වර්ෂය වන විට රු.48,440,571 දක්වා ක්‍රමයෙන් පිරිහී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යය සාධනය**

1985 අංක 09 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව, තම රාජකාරී කටයුතු ඉටුකරන අතරතුර දී තුවාල ලද හෝ මියගිය පොලිස් බලකායේ හෝ සන්නද්ධ හමුදාවල හෝ යම් සාමාජිකයෙකුගේ පවුල්වලට යම් ප්‍රතිලාභ ගෙවීම ඇතුළුව ජාතික ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමට සහ සහතික කිරීමට වඩාත්ම හේතුවන්නේ යයි අරමුදලේ පාලක මණ්ඩලය අදහස් කරන ආකාරයට සහ අරමුදලට අයත් මුදල් ජනාධිපතිවරයාගේ විධිවිධානවලට යටත්ව යොදාගැනීම අරමුදලේ පාලක මණ්ඩලයේ ප්‍රධාන කාර්යය වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ඉහත අරමුණු ඉටුකර ගැනීම පිළිබඳව සිදුකරන ලද පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අරමුදල විසින් වාර්ෂිකව උපයන ආදායම අදාළ අරමුණු සඳහා උපයෝගී කරගැනීම ඉතා දුර්වල තත්ත්වයක පැවති බව පහත සඳහන් දත්ත අනුව නිරීක්ෂණය විය.

| වර්ෂය | ලැබී ඇති මුළු ආදායම | සුභසාධක වියදම | ලද ආදායමෙන් සුභසාධක වියදම් සඳහා වැය කර ඇති ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු. | රු. | % |
| 2015 | 54,842,601 | 6,214,506 | 11.33 |
| 2014 | 69,967,787 | 3,698,843 | 5.29 |
| 2013 | 84,776,544 | 3,892,332 | 4.59 |
| 2012 | 64,988,177 | 7,273,184 | 11.19 |
| 2011 | 49,082,045 | 32,250 | 0.06 |

(ආ) විගණනයට ලැබී ඇති තොරතුරු අනුව යුද්ධයෙන් මියගිය හා අතුරුදහන් වූ ත්‍රිවිධ හමුදාවට අයත් සාමාජික සංඛ්‍යාව 25,273 ක් හා ආබාධිත රණවිරුවන් සංඛ්‍යාව 18,942 ක් වුවත් සමාලෝචිත වර්ෂය තුළදී එම පවුල්වල 5 වසරේ ශිෂ්‍යත්වය සමත් දරුවන් 230 දෙනෙකු වෙත රු. 5,750,000 ක් වටිනා ඉතුරුම් තැන්පත් ප්‍රදානය කිරීම පමණක් සිදුකර තිබුණි. මේ අනුව ආබාධිත , මියගිය හා අතුරුදහන් වූ නිළධාරීන්ගේ පවුල්වලින් ඉතාමත් සීමිත ප්‍රමාණයකට පමණක් සහන සලසා තිබූ අතර සමස්ත සාමාජික ප්‍රජාව වෙනුවෙන් විධිමත් වැඩපිළිවෙලක් මත සහන සැලසීම සඳහා ගතහැකි වෙනත් විකල්ප ක්‍රියාමාර්ග කෙරෙහි අරමුදලේ අවධානය යොමුකර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යුද්ධ හමුදාවේ පරිහරණය සඳහා කුලියට ලබාදී තිබුණු අරමුදල සතු නිවාස 03 ක් වෙනුවෙන් 2012 දෙසැම්බර් මාසයේ සිට 2015 වර්ෂය අවසානය දක්වා එකතුව රු. 1,110,000 ක් වූ නිවාස කුලී 2016 අගෝස්තු 18 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, මේ සම්බන්ධයෙන් යුධ හමුදාව සමඟ කුලී ගිවිසුමකට එළඹ තිබුණු බවට පිළිගත හැකි සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) ජාතික ආරක්ෂක අරමුදල වෙත 1987 වර්ෂයේදී පරිත්‍යාගයක් ලෙස ලැබී තිබූ දැනට ජනාධිපති ලේකම් කාර්යාලයේ තැන්පත් කර තිබෙන පිරමීඩාකාර වීදුරු ආවරණයකින් සමන්විත මැණික් ඔබ්බවන ලද ඔටු රූපය රු. 2,890,415 ක් වටිනා බව ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ නිලධාරීන්ගෙන් සමන්විත සමීක්ෂණ මණ්ඩලයක් මගින් සමාලෝචිත වර්ෂය තුළදී තක්සේරු කර තිබුණි. මැණික්වල දළ බර ක්‍රාත් 1417.9 ක් බව සඳහන් වූ මෙහි පත්මරාග, මරකත, වෛරෝඩි , ආරනුල් , නිල් කුරුවින්ද වැනි මැණික් වර්ග 11 කින් සමන්විත වූ බව තක්සේරු වාර්තාවේ සඳහන් විය. කෙසේ වෙතත් වීදුරු ආවරණය හේතුවෙන් අදාල මැණික්වල ස්වභාවය නිශ්චිතව තක්සේරු නොකර ස්වභාවික මැණික් ලෙස උපකල්පනය කර අදාල දළ තක්සේරුව ලබා දී තිබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ඇ) අදාල සාමාජිකයන් රැස්කර ගැනීමේ අපහසුතාවය හේතුවෙන් පාලක මණ්ඩල රැස්වීම් පැවැත්වීමට නොහැකි වූ බව අරමුදලේ ලේකම් විසින් විගණනයට දන්වා තිබුණි. මෙම තත්ත්වය අරමුදලේ කටයුතු මෙහෙයවීම හා වැදගත් තීරණ ගැනීම කෙරෙහි ඍජු ලෙස බලපා ඇති බව නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

2002 මැයි 24 දිනැති අංක පීඑෆ්/පීඊ 21 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂයක් අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එය මාස 04 ක් ප්‍රමාද වී 2016 ජුනි 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 5.2 අයවැය ලේඛනය

---

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 (ඇ) වගන්තිය අනුව අනුමත කරන ලද අයවැය ලේඛනයකින් තොරව අදාළ මුදල් වර්ෂයේදී කිසිදු වියදමක් නොදැරිය යුතු වුවත්, අරමුදල විසින් ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී රු. 6,237,606 ක වියදම් දරා තිබුණි.

### 5.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

---

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදයේ දැක්වෙන පරිදි අරමුදල් පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කර ගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අවධානයට යොමු කරන ලදි.